

# බොහෝ බලතල ඇති ජාතික ඖෂධ අධිකාරිය


**වෛද්‍ය බී එෆ්. එස්. සමරනායක**

අධ්‍යක්ෂක ජාතික ඖෂධ අධිකාරිය


තමන්ට වෛද්‍යවරයකු විසින් ඖෂධ නියමිත ප්‍රමිතියෙන් යුක්තව ලැබේ දැයි බොහෝ රෝගීන් තුළ ඇත්තේ අවිනිශ්චිතතාවකි. වෛද්‍යවරයා යම් රෝගියකුට ඖෂධ නියම කළ යුත්තේ ඖෂධ නාමයෙන් පමණක්ය යන්න සම්මතයක්ව පැවතුණත්, බොහෝ වෛද්‍යවරු වෙළෙඳ නාමයෙන් ඖෂධ නියම කිරීම රෝගීන්ට කරන යම් අසාධාරණයක් වශයෙන් සමහරු හඳුන්වති. මෙවන් ඖෂධ බොහෝ විට අධික මිලක් නියම වී ඇති ඖෂධයක් වේ. මෙම බෙහෙත් තුණ්ඩුව රැගෙන ඔසුහල් කරා යන රෝගීන් එහිදී ද අසරණ වෙති.


ඒ හතු පිපෙන්නාක් මෙන් මතු වී ඇති විවිධාකාරයේ ඔසු හල් අතරින් නීත්‍යානුකූලව පවත්වාගෙන යන ඔසු හල් කවරේද කියා තේරුම් බේරුම් කර ගැනීමට නොහැකි නිසාය.

කෙසේ හෝ ඔසු සලකට ගොඩ වූ පසු ඖෂධ නාමයෙන් ලියා තිබුණත්, වැඩිම මිලක් නියම කර ඇති ඖෂධ රෝගීන්ට නිකුත් කිරීමට ඔසු සල් හිමියන් පෙළඹීම නිසා රෝගීහු තවත් අසරණ වෙති.

මෙවන් අසරණ රෝගීන් කූඨ ජාවාරම්කරුවන්ගෙන් ආරක්ෂා කිරීමට ඉදිරිපත්වන ආයතනයක් ඇත. ඒ රජයේ පූර්ණ අධීක්ෂණය යටතේ පවතින ජාතික ඖෂධ අධිකාරියයි.

ජාතික ඖෂධ අධිකාරිය මඟින් කෙරෙනුයේ කුමන කාර්යයක්ද යන්න දැනගැනීමට අපි එහි අධ්‍යක්ෂක වෛද්‍ය බී. එෆ්. එස්. සමරනායක මහතාව හමුවීමු. තම ආයතනය මඟින් කරන කාර්යයන් හා සේවාවන් ගැන ඔහු මෙසේ අදහස් දැක්වීය.

අපගේ මූලික අරමුණ වන්නේ ජනතාව විසින් භාවිත කරන ඖෂධ ආරක්ෂාකාරී ගුණාත්මක මෙන්ම ක්‍රියාකාරී ඖෂධ වශයෙන් ජනතාවට ලැබෙන බවට වග බලා ගැනීමයි. මෙහිදී ඖෂධ පමණක්ම නොවේ, විලවුන් වර්ග මෙන්ම වෛද්‍ය උපකරණත් යම් ප්‍රමිතියකට යටත් කිරීමක් අප ආයතනය මඟින් සිදු කෙරේ.



දැනට ලංකාවේ භාවිතාවන ඖෂධ ප්‍රමාණයෙන් 85% ක්ම ආනයනික ඖෂධ වන අතර මෙරට නිෂ්පාදනය කෙරෙනුයේ 15% වැනි සුළු ප්‍රතිශතයකි. වසරකට මෙලෙස ආනයනය කරන ඖෂධ ප්‍රමාණය බිලියන 750 ක් පමණ වේ. ආනයනය කරන බෙහෙත් වර්ග ප්‍රමාණය 750 වන අතර මෙම අති විශාල ඖෂධ ප්‍රමාණය හා මෙරට දී නිෂ්පාදනය කරන අනෙකුත් ඖෂධ සියල්ලේම ගුණාත්මක බව ඖෂධ පාලනය කිරීමේ බලතල අප ආයතනය සතුව ඇත. අප ආයතනය පාලනය වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් යටතේ යි. මෙම ආයතනයේ නිසි බලධරයා වන්නේජාතික ඖෂධ අධිකාරියේ අධ්‍යක්ෂකවරයායි.

1. පරිපාලනය
2. ඖෂධ ඇගයුම
3. නීති ක්‍රියාත්මක කිරීම යන අංශ අධ්‍යක්ෂකවරයාගේ සෘජු පාලනයට යටතට පත්වේ. මෙම අංශ වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා ආහාර ඖෂධ පරීක්ෂකයන් ප්‍රාදේශීය ඖෂධ වේදීන් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ද සම්බන්ධ කර ගැනේ.

මෙරට ආනයනය කරන හෝ මෙරට දී නිෂ්පාදනය කරන ඖෂධයන්

1. ආනයනය
2. ලියාපදිංචිය
විකිණීම
4. වෙළෙඳම
5. ප්‍රවාහනය
6. ප්‍රචාරනය යන අංශ පාලනය කිරීම අපගේ මූලික කාර්යයන් ලෙස ළඝු කොට දැක්විය හැකියි.

ලියාපදිංචිය ඖෂධයන්, විලවුන් වර්ග මෙන්ම වෛද්‍ය උපකරණ ආනයනයේ දී හෝ නිෂ්පාදනය කර වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ දී හෝ අනිවාර්යයෙන්ම අප ආයතනයේ ලියා පදිංචි කළ යුතුවේ. මෙසේ ලියා පදිංචි නොකළ හොර රහසේ මෙරටට ගෙන්වන ඖෂධ පිළිබඳ අපට දැනගැනීමට ලැබුණ හොත් ඒ පිළිබඳ විමර්ශනයක් කර එම ඖෂධ තහනම් කිරීමට හා ඔවුන්ට විරුද්ධව නීති මගින් කටයුතු කිරීමට අප පසුබට වන්නේනැත. දැනටමත් මෙවැනි ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුට නීති මඟින් කටයුතු කර තිබේ. යම් අයකු ඖෂධයක් මෙරට වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් ඔහු විසින් සපුරා ලිය යුතු කොන්දේසි ගණනාවක් ඇත. එනම්, එම ඖෂධය අනුමත ජාත්‍යන්තර ඖෂධ සංග්‍රහයන්ට යටත්ව සකස්කර ඇති බවට සහතිකයක් මෙන්ම, ඖෂධ නිෂ්පාදනයේ දී ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනය කර ඇති බවට තත්ත්ව සහතිකයකුත්මේ සඳහා ඉදිරිපත් කළ යුතුවේ.

මේ සියලූ කාරණා සපුරා තිබුණත්, අප ආයතනයේ ඇති විද්‍යාගාරයේ දී මෙම ඖෂධ නැවත පරීක්ෂාවන්ට භාජනය කරනු ලැබේ. ඉන්පසුව මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල ද සමඟින් සියලූම කරුණු විශ්ලේෂක මණ්ඩලයක් වෙත ඉදිරිපත් කෙරේ. මෙම විශ්ලේෂක මණ්ඩලයට රජයේ රසපරීක්ෂක තත්ත්ව පාලන රසායනාගාරය වෛද්‍ය පරීක්ෂණ ආයතනය යන ආයතන හා පුද්ගලයන් අයත් වේ.

මෙම කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද කරුනු ගැන සොයා බලා මෙම ඖෂධය මෙරට වෙළෙඳ පොළට නිකුත් කිරීමට සුදුසු ද යන්න පිළිබඳ අවසන් නිගමනයකට පැමිණේ.

මෙසේ අනුමත වූ ඖෂධ මෙරට වෙළෙඳ පොළට පැමිණි පසු ඒවා ගැන සුපරීක්ෂාකාරීව සොයා බැලීමට අනු කමිටු හතරක් පත්කර තිබේ.


1. ඖෂධ අගැයිම් අනු කමිටුව
2. විලවුන් අගැයීම් අනු කමිටුව
3. වෛද්‍ය උපකරණ
   අගැයිම් අනු කමිටුව
4. ප්‍රචාරක අගැයිම් අනු කමිටුව

එම අනු කමිටු හතරයි.

මෙම එක් එක් අනු කමිටු මඟින් විටින් විට අහඹු ලෙස තෝරාගත් සාම්පලයන් අප පරීක්ෂණාගාරයේ දී පර්යේෂණයන්ට ලක් කර ඒවායේ ගුණාත්මක භාවය පිළිබඳ සොයා බලනු ලැබේ. විලවුන් අගැයුම් කමිටුව මඟින් සිදු කරනුයේ ශරීරයේ සම පිරිසිදු කිරීමට වැඩි දියුණු කිරීමට වෙනස් කිරීමට ගන්නා ඖෂධ පාලනය කිරීමයි. උදාහරණයක් වශයෙන් දැක්වුවහොත් හිස කළු කිරීමට ගන්නා ඩයි වර්ග දැක්විය හැකිය.

වෛද්‍ය උපකරණ අගැයිම් කමිටුව මඟින් කරෙනුයේ රෝග විනිශ්චය කිරීම, ප්‍රතිකාර කිරීම, ශරීරයේ ක්‍රියාකාරිත්වය පුනරුත්තාපනය හා නිවැරදි කිරීමට ගන්නා උපකරණ ගැන සුපරීක්ෂාකාරීව සිටීමයි. උණ බැලීමට ගන්නා උණ කටුව මෙයට හොඳම උදාහරණයක්.

ලියාපදිංචිය ඖෂධයන්, විලවුන් වර්ග මෙන්ම වෛද්‍ය උපකරණ ආනයනයේ දී හෝ නිෂ්පාදනය කර වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ දී හෝ අනිවාර්යයෙන්ම අප ආයතනයේ ලියා පදිංචි කළ යුතුවේ. මෙසේ ලියා පදිංචි නොකළ හොර රහසේ මෙරටට ගෙන්වන ඖෂධ පිළිබඳ අපට දැනගැනීමට ලැබුණ හොත් ඒ පිළිබඳ විමර්ශනයක් කර එම ඖෂධ තහනම් කිරීමට හා ඔවුන්ට විරුද්ධව නීති මගින් කටයුතු කිරීමට අප පසුබට වන්නේනැත. දැනටමත් මෙවැනි ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුට නීති මඟින් කටයුතු කර තිබේ. යම් අයකු ඖෂධයක් මෙරට වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් ඔහු විසින් සපුරා ලිය යුතු කොන්දේසි ගණනාවක් ඇත.



## ප්‍රචාරණය

ඖෂධ ප්‍රචාරක කටයුතු අපගේ පාලනයට යටත් කර ඇත. මේ යටතේ පැරසිටමෝල් මිල්ක් ඔෆ් මැග්නීසියා වැනි අන්තරාකාරී නොවන ඖෂධ වර්ග පමණයි ප්‍රචාරය සඳහා අවසර දී ඇත. එමෙන්ම අසත්‍ය නොමග යවන සුලු හා අතිශයෝක්තියෙන් කරන වර්ණනා සහිත ප්‍රචාරයන් ද මේ අනුව තහනම් වේ.

## මිල පාලනය

අප බොහෝ දෙනා මුහුණ දෙන ගැටලුවක් නම් එකම ඖෂධය විවිධ නම්, මිලගණන් යටතේ අලෙවි කිරීමයි. උදාහරණයක් වශයෙන් පැරසි-ටමෝල් පෙත්තක් ශත ගණනේ සිට රුපියල් ගණනක් දක්වා විවිධ මිල පරාසයන් යටතේ වෙළෙඳ පොළේ දක්නට ලැබේ. එකම ගුණයක් ඇති මෙවැනි ඖෂධ විවිධ මිල ගණන්වලට විකිණීම පාලනය කිරීමට බැරිද යන්න අපට නගන බලවත් චෝදනාවකි. එහෙත් කණගා-ටුවෙන් කිවයුත්තේ මෙවැනි බොහෝ ඖෂධ සම්බන්ධයෙන් තිබූ මිල පාලනය පසුගිය වකා-වානුවේ දී ඉවත් කළ බවය.

මේ නිසා දැන් ඕනෑම අයකුට තමන් කැමති මිලක් ඖෂධ සඳහා නියම කළ හැකියි. මේ අසා-ධාරණ තත්ත්වය පිළිබඳ සිතා බලා රජය විසින් නැවතත් බොහෝ ඖෂධ සඳහා මිල පාලනයක් පැනවීමට සියලු කටයුතු මේ වන විට සූදානම් කර තිබේ.

අසරණ රෝගීන්ට නම් මෙය සුබ දායක ආරං-චියක් විය හැකියි. මිල පාලනයක් ඇති කළත් ඒ සම්බන්ධව කටයුතු කරන්නේ සෞඛ්‍යය අමා-ත්‍යාංශය හා පාරිභෝගික අධිකාරියයි.

## ඖෂධ අලෙවි සල්

බොහෝ අයට ප්‍රශ්නයක් ව පවතින ඖෂධ අලෙවි සැල් පාලනය කිරීමේ වගකීමද අප සතුව පවතී. සෑම ඖෂධ අලෙවි සැලක්ම අනි-වාර්යයෙන්ම අප ආයතනයේ ලියාපදිංචි විය යුතු වේ. මේ සඳහා අප විසින් සහතික පත්‍රයක් ඔවුන් වෙත නිකුත් කරනු ලබයි. මෙම සහතික පත්‍රය අනිවාර්යයෙන්ම ඔවුන්ගේ වෙළෙඳ සැල තුළ ප්‍රදර්ශනය කළ යුතු වේ.

**වෛද්‍යවරයකු ලියා දෙන ඖෂධ වර්ගය පිළිබඳ දැනුවත් වීම රෝගියා සතු වගකීමකි. මේ පිළිබඳ වෛද්‍යවරයාගෙන් අසා දැන ගැනීමේ අයිතිය ද ඔබට තිබේ. එමෙන්ම ඖෂධ මිලදී ගැනීමේ දී එම වර්ගයෙන් තිබෙන අඩුම මිල සහිත ඖෂධය කුමක් දැයි අසා එයම මිලදී ගැනීමට ඔබ පසුබට විය යුතු නැත. මන්දයත් මනා තත්ත්ව පාලනයකට යටත් කර මෙරට වෙළෙඳ පොළට ඖෂධ නිකුත් කරන නිසා වෙළෙඳ නාමය කුමක් වුවත් ගුණාත්මක භාවයෙන් එක සමාන නිසා ඒ පිළිබඳ කිසිම බියක් ඇති කර ගත යුතු නොවේ. යම් ඖෂධ අලෙවි සැලක මෙම සහතිකය ප්‍රදර්ශනය කර නැත්නම් එය අනුමත අලෙවිසැලක් නොවීමට. පුළුවන. මෙවැනි සැක සහිත ඔසු සැලක් පිළිබඳව ඔබ පළාතේ සෞඛ්‍යය අධ්‍යක්ෂවරයාට පැමිණිලි කළ හැකියි.**

## ඖෂධ ගැන දැනුවත් වීම

වෛද්‍යවරයකු ලියා දෙන ඖෂධ වර්ගය පිළිබඳ දැනුවත් වීම රෝගියා සතු වගකීමකි. මේ පිළිබඳ වෛද්‍යවරයාගෙන් අසා දැන ගැනීමේ අයිතිය ද ඔබට තිබේ. එමෙන්ම ඖෂධ මිලදී ගැනීමේ දී එම වර්ගයෙන් තිබෙන අඩුම මිල සහිත ඖෂධය කුමක් දැයි අසා එයම මිලදී ගැනීමට ඔබ පසුබට විය යුතු නැත. මන්-දයත් මනා තත්ත්ව පාලනයකට යටත් කර මෙරට වෙළෙඳ පොළට ඖෂධ නිකුත් කරන නිසා වෙළෙඳ නාමය කුමක් වුවත් ගුණාත්මක භාවයෙන් එක සමාන නිසා ඒ පිළිබඳ කිසිම බියක් ඇති කර ගත යුතු නොවේ.

## පැමිණිලි

යම් ඖෂධ අලෙවි සැලක මෙම සහතිකය ප්‍රදර්ශනය කර නැත්නම් එය අනුමත අලෙවි-සැලක් නොවීමට පුළුවන. මෙවැනි සැක සහිත ඔසු සැලක් පිළිබඳව ඔබ පළාතේ සෞඛ්‍යය අධ්‍යක්ෂවරයාට පැමිණිලි කළ හැකියි. නැත-හොත් කෙළින්ම අපටද දැන්විය හැකියි. එමෙන්ම ඖෂධ සම්බන්ධයෙන් වන ඕනෑම පැමිණිල්ලක් හෝ දැනුවත් වීමක් හෝ අවශ්‍ය-නම් ඒ සඳහා සහාය වීමට අප බැඳී සිටී. ඖෂධ හෝ ඖෂධ වෙළඳසල් පිළිබඳ පැමිණිලි මෙන්ම ඖෂධ ගැන දැනුවත් වීමක් ඔබට අවශ්‍ය නම් ජාතික ඖෂධ අධිකාරියේ අංක 0112 – 687743 දරන දුරකතනය ඔබ වෙනු-වෙන් විවෘතව පවතී. ❑

සාකච්ඡා කළේ
**මොහාන්**